සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 61 S I

නම: .............................................. | **භූගෝල විද්‍යාව** | කාලය : පැය එකයි

සැලකිය යුතුයි :

**I කොටස**

- **මෙම පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01) පෘථිවි තලයෙන් ................................ ක් ම සාගරයෙන් වැසී ඇත.
(71%, 29%, 97%)

02) ................................................................................ කඳු වැටිය උතුරු ඇමරිකා මහාද්වීපය තුළ පිහිටා ඇත.
(ඇන්ඩීස් /රොකී/ඇට්ලස්)

03) තේම්ස් ගංගාව ........................................................................................ ආරම්භ වේ.
(ග්ලැෂියර් දියවූ ජලයෙන් / විලකින් / උල්පතකින්)

04) ශ්‍රී ලංකාවට අයත් විශාලතම භූගත ජල ද්‍රෝණිය ...................................................................... ප්‍රදේශයේ පිහිටා ඇත.
(වනාතවිල්ලුව / යාපනය / එප්පාවල )

05) පොප්ලර්, ස්ප්‍රෘස් වැනි ගස් වර්ග බහුලව දක්නට ලැබෙන්නේ, ....................................................... වනාන්තර තුළ ය.
(කේතුධර / සෞම්‍ය කලාපීය / නිවර්තන වර්ෂා)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල එක් එක් ප්‍රකාශය නිවැරදි නම් " නි" යන්න වටා ද වැරදි නම් " වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

06) සාගරික කබොල මුළු මනින්න සෑදී ඇත්තේ, බැසෝල්ට් පාෂාණ වලිනි. (.............)

07) අරාබි මුහුද සහ චීන මුහුද සාගරයේම කොටසක් ලෙස පවතින මුහුදු වලට උදාහරණ වේ. (.............)

08) "මියන්මාරය" ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයකි. (.............)

09) ලෝක ජන සංඛ්‍යාවෙන් බහුතරයක් වාසය කරන්නේ, දක්ෂිණ අර්ධගෝලය තුළය. (.............)

10) මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් නුගේගොඩ, රාගම, වේයන්ගොඩ ආදී ප්‍රදේශවල ගුවන් පාලම් ඉදිකර තිබේ. (.............)

- **අංක 11 සිට 16 තෙක් ප්‍රශ්න වල හිස්තැන් වලට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

11) ශාක පත්‍ර තුළ ඇති ජලය ........................................................................ මගින් වායුගෝලයට එකතු වේ.

12) ධමනි මිනිරන් බහුලව ඇති බෝගල පතල ............................................................. දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

13) හුණුගල්, වැලිගල්, වැනි පාෂාණ ................................................................. පාෂාණ ගණයට අයත් වේ.


14) යුරෝපය හා ආසියාව අයත්වන භූ තැටිය ............................................................. තැටිය ලෙස හඳුන්වයි.

15) ශ්‍රී ලංකාවේ විද්‍යුත් උපකරණ නිපදවීමේ කර්මාන්ත බොහෝ විට..............................පරිමාණයේ කර්මාන්ත වේ.

16) වැඩිවන විදුලි ඉල්ලුම සපුරාලීම හා අඩුවියදම් බලශක්ති උත්පාදනය කෙරෙහි අවධානය යොමුකිරීම සඳහා ..........................................................විදුලි බලශක්ති අධිකාරිය පිහිටුවා ඇත.

• අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කරගන්න.

ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධාන මූලාශ්‍ර 2009-2013




17) ඇඟලුම් අංශයේ විදේශ විනිමය ඉපැයීම ඩොලර් බිලියන හතර ඉක්මවා ඇත්තේ ................................................ වර්ෂයේදී පමණි.

18) රබර් අපනයනයෙන් වැඩිම විදේශ විනිමයක් උපයා ඇත්තේ ................................................ වර්ෂයේ ය.

19) 2012 වර්ෂය තුළ සංචාරක කර්මාන්තයෙන් උපයා ඇති විදේශ විනිමය ප්‍රමාණය ඩොලර් බිලියන ................................................ කි.

• අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව "ආ" තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

20)

| "අ" **සානුව** | "ආ" **පිහිටි මහද්වීපය** |
|---|---|
| 1. බ්‍රසීලියානු සානුව | A - ආසියාව |
| 2. බියෙ සානුව | B - දකුණු ඇමෙරිකාව |
| 3. ඉරාන සානුව | C - අප්‍රිකාව |
| | D - යුරෝපය |

1) B,A,D 2) B,C,A 3) C,B,A 4) B,D,A (...................)

21)

| "අ" **රට** | "ආ" **යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානය** |
|---|---|
| 1. ජපානය | A - යුරල් කලාපය |
| 2. රුසියාව | B - පිට්ස්බර්ග් |
| 3. එක්සත් රාජධානිය | C - ඔසාකා |
| | D - බර්මිංහැම් |

1) B,C,D 2) A,D,B 3) C,A,D 4) D,A,B (...................)

22)

| "අ" **බෝගය** | "ආ" **පර්යේෂණ ආයතනය** |
|---|---|
| 1. තේ | A - අගලවත්ත |
| 2. රබර් | B - මහඉලුප්පල්ලම |
| 3. පොල් | C - ලුණුවිල |
| | D - තලවකැලේ |

1) D,A,C 2) D,A,B 3) A,D,B 4) A,D,C (...................)

23) "අ" "ආ"

**බලාගාරය** | **පිහිටි ප්‍රදේශය**

| **"අ" බලාගාරය** | **"ආ" පිහිටි ප්‍රදේශය** |
|---|---|
| 1. තාප විදුලි බලාගාරය | A - කෙරවලපිටිය |
| 2. සුළං විදුලි බලාගාරය | B - බෝවතැන්න |
| 3. සූර්ය බලශක්ති බලාගාරය | C - පුත්තලම |
| | D - බරුතකන්ද |

1) C,D,B 2) B,A,D 3) D,C,A 4) A,C,D (...................)

24)

| **"අ" ඛනිජ වර්ගය** | **"ආ" අයත් වන ඛනිජ** |
|---|---|
| 1. ඉන්ධනමය ඛනිජ | A - තඹ |
| 2. ලෝහමය ඛනිජ | B - මැණික් |
| 3. ලෝහමය නොවන ඛනිජ | C - ඛනිජ තෙල් |
| | D - ග්‍රැනයිට් |

1) C,A,D 2) D,B,A 3) C,A,B 4) B,A,D (...................)

- **අංක 25 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

25) ජල හිගය නිසා වී වගාවට බහුලව හානි සිදුවන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයක් වන්නේ,

1) ගාල්ල 2) මාතර 3) කළුතර 4) හම්බන්තොට (...................)

26) පැසිෆික් සාගරය තුළ පිහිටා ඇති දූපතක් වන්නේ මින් කුමක් ද?

1) මැඩගස්කරය
2) අයිස්ලන්තය
3) සුමාත්‍රා
4) තායිවානය (...................)

27) අපරිවර්තීගෝලය තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,

1) පතන ශීඝ්‍රතාවය සිදුවීම.
2) වේගවත් සුළං ධාරා හැමීම.
3) පෘථිවිය කරා එන උල්කාපාත දැවීයාම.
4) සියලු කාලගුණික සංසිද්ධි සිදුවීම. (...................)

28) නිරායාසයෙන් ලැබෙන සම්පතක් නොවන්නේ මින් කුමක් ද?

1) පස 2) හිරු එළිය 3) වාරි ජලය 4) වාතය (...................)

29) රතු දුඹුරු පස සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?

1) එළවළු හා තෘණ වගාවට සුදුසු වේ.
2) වියළි කලාපයට සීමා වූ පසකි.
3) තෙත් කලාපයට ආවේණික පසකි.
4) ගංගා අවට තැනිතලාවල ව්‍යාප්තව ඇත. (...................)

30) ශ්‍රී ලංකාවේ වැඩිම ජන සංඛ්‍යාවක් සිටින දිස්ත්‍රික්ක තුන පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1) කොළඹ, ගම්පහ, මහනුවර
2) කොළඹ, ගම්පහ, කුරුණෑගල
3) කොළඹ, ගම්පහ, ගාල්ල
4) කොළඹ,ගම්පහ, කළුතර (...................)

31) පහත සඳහන් එළවළු වර්ග අතුරෙන් කඳුරට කලාපයේ බහුලව වගා කරන එළවළු වර්ග ඇතුළත් පිළිතුර තෝරන්න.

1) ලීක්ස්, මුරුංගා, පතෝල
2) අර්තාපල්, කැරට්, කැකිරි
3) කැරට්, වැටකොළු, අර්තාපල්
4) ගෝවා, අර්තාපල්, බීට් (...................)

32) රබර් වගාව සඳහා අවශ්‍ය භෞතික සාධකයක් වන්නේ,

1) දියළු පස
2) පුහුණු ශ්‍රමය
3) 1900 mm - 5460 mm වර්ෂාපතනය
4) $27^0$C උෂ්ණත්වය (...................)

33) පහත තොරතුරු අතුරෙන් ශ්‍රී ලංකාවේ වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර වල දක්නට ලැබෙන ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

A - ප්‍රධාන වර්ෂා ඍතුව ඊසාන දිග මෝසම වේ.
B - 1200 mm ට වැඩි උස් බිම්වල ව්‍යාප්තව ඇත.
C - වියළි කාලයේ ඇතැම් ගස්වල කොළ හැලේ.
D - වියන් ස්ථර කිහිපයකින් සමන්විත වේ.

1) A හා C  2) C හා D  3) A හා D  4) B හා D  (....................)

34) ලොව ජනාධික රටවල් දහය අතුරින් දකුණු ඇමෙරිකාවේ පිහිටි රට කුමක් ද?

1) බ්‍රසීලය  2) බංගලාදේශය  3) නයිජීරියාව  4) රුසියාව  (....................)

35) ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය කෙරෙහි බලපාන මනුෂ සාධකයක් වන්නේ,

1) ජලවහනය  2) කර්මාන්ත  3) භූ විෂමතාවය  4) දේශගුණය  (....................)

36) ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියම් පත්‍රයක දිග හා පළල නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

1) 40 Km × 25 Km  2) 80 cm × 50 cm
3) 80 Km × 50 Km  4) 40 cm × 25 cm  (....................)

37) ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියමක කළු වර්ණයෙන් පෙන්නුම් කරන ලක්ෂණයක් වන්නේ,

1) හෝටලය  2) සංචාරක බංගලාව  3) තානායම  4) රෝහල  (....................)

- **පහත A, B, C සහ D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - 1. පරිසර සමතුලිතතාවය
    2. තිරසර සංවර්ධනය

B - 1. ආයු අපේක්ෂාව
    2. වියපත් ජන සංඛ්‍යාව

C - 1. පොසිල ඉන්ධන දහනය
    2. පුනර්ජනනීය බලශක්තිය

D - 1. වනාන්තර
    2. වන ජීවීන්

38) පළමුවැන්නේ පැවැත්ම සඳහා දෙවැන්න අවශ්‍යවේ යැයි සැලකිය හැකි මාතෘකා යුගලය මින් කුමක් ද?

1) A  2) B  3) C  4) D  (....................)

39) පළමුවැන්නේ වර්ධනය දෙවැන්නේ ද වර්ධනයට හේතුවේ යැයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?

1) A  2) B  3) C  4) D  (....................)

40) පළමුවැන්නේ අහිතකර ප්‍රතිඵල අවම කිරීමට දෙවැන්න බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

1) A  2) B  3) C  4) D  (....................)

* * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 61 S II

නම: ..........................................

භූගෝල විද්‍යාව

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :

**• මෙම පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.**

**• I කොටසේ I ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

## I කොටස

01) (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා 1:50, 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදාගන්න.

• අංක (i) සිට අංක (iv) තෙක් අසා ඇති ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) A-B රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද? (ල.01)
(අවතල බෑවුම/උත්තල බෑවුම / මොහොර බෑවුම)

(ii) අංක ① න් දක්වා ඇති මායිම කුමක් ද?
(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම/දිස්ත්‍රික් මායිම/ පළාත් මායිම) (ල.01)

(iii) අංක ② න් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(වැලිතලාව / ගල්වල / ගල) (ල.01)

(iv) අංක ③ න් දක්වා ඇත්තේ කුමක් ද?
(ස්ථානීය උස/ත්‍රිකෝණමිතික උස/ජාතික බණ්ඩාංක) (ල.01)

(v) Ⓓ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද? (ල.01)

(vi) A5 මාර්ගය ආසන්නයේ පිහිටි සංකේත මගින් නිරූපණය කෙරෙන පොදු සේවා සපයන ආයතන දෙකක් සඳහන් කරන්න. (ල.02)

• සිතියම් ගත ප්‍රදේශය හා සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒවා නිවැරදි නම් ''නි'' යන්න ද වැරදි නම් ''වැ'' යන්න ද යොදන්න.

(vii) සිතියම් ගත ප්‍රදේශ පළාත් දෙකකට අයත් වේ. (ල.01)

(viii) C අක්ෂරයෙන් දක්වා කොටුකර ඇති ප්‍රදේශයේ විශාලත්වය වර්ග කිලෝමීටර් 2ක් පමණ වේ. (ල.01)

(ix) සමස්ථ සිතියම්ගත ප්‍රදේශය වනාන්තර වලින් වැසී පවතී. (ල.01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුවේ කොටු යොදාගන්න.

• අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබඳව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) රතු මුහුද U,V,W
(ii) පිරනීස් කඳු H,I,J
(iii) මැකෙන්සි ගඟ M,N,O
(iv) යෝර්ක් තුඩුව D,E,F
(v) දිල්ලි නගරය R,S,T


(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුවේ කොටු යොදාගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

| | |
|---|---|
| (i) බුන්දල ජාතික උද්‍යානය | G,H,I |
| (ii) පොල් පර්යේෂණ ආයතනය | A,B,C |
| (iii) ඛණිජ වැලි නිධියක් පිහිටි පුල්මුඩේ | M,N,O |
| (iv) කොඩ්ඩියාර් බොක්ක | D,E,F |
| (v) කළු ගඟ | Q,R,S |

## II කොටස

02) යාබදව දක්වා ඇත්තේ ජල චක්‍රයේ විවිධ අවස්ථා දැක්වෙන රූප සටහනකි.




(i) රූප සටහනට අනුව ජල චක්‍රයේ E සහ C අවස්ථා දෙක මොනවාදැයි නම් කරන්න. (ල.02)


(ii) P වලින් දැක්වෙන අවස්ථාව නම්කර එහි ඇති වැදගත්කම් දෙකක් සඳහන් කරන්න. (ල.03)

(iii) a) වර්තමානයේ ලොව බොහෝ රටවල් පානීය ජල හිගයකට මුහුණ පා ඇත. ඊට හේතු දෙකක් සඳහන් කරන්න.

b) පානීය ජල හිඟය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල.05)

- අංක 03 හා 04 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ලෝක සිතියම ආධාර කරගන්න.




03) (i) යාබද ලෝක සිතියමේ A සහ B අක්ෂර වලින් දක්වා ඇති වනාන්තර වර්ග දෙක පිළිවෙලින් නම් කරන්න. (ල.02)

(ii) B අක්ෂරයෙන් දක්වා ඇති වනාන්තර වල කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) a) වනාන්තර විනාශය කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

b) වනාන්තර සංරක්ෂණය සඳහා ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

04) (i) ඉහත ලෝක සිතියමේ C හා D අක්ෂර වලින් දක්වා ඇති මෝටර් රථ කර්මාන්තයට ප්‍රසිද්ධ රටවල් දෙක පිළිවෙලින් නම් කරන්න. (ල.02)

(ii) මෝටර් රථ කර්මාන්තයේ මෑතකාලීන ප්‍රවණතා තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) මෝටර් රථ කර්මාන්තයේ නියුතු රටවල් වර්තමානයේ මුහුණපාන ගැටළු තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.05)

05) • අර්ජන්ටිනාව • ඩෙන්මාර්කය • නවසීලන්තය • ඕස්ට්‍රේලියාව

(i) ඉහත රටවල් අතුරින් කිරි පට්ටි පාලනය සඳහා වැදගත් වන
a) යුරෝපා රටක් ද,
b) පැසිෆික් සාගරයේ පිහිටි දූපත් රාජ්‍යය ද නම් කරන්න. (ල.02)

(ii) කිරි නිෂ්පාදනය හැරුණු විට සත්ත්ව පාලනය ඇසුරින් ලබාගන්නා කාර්මික අමුද්‍රව්‍ය තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) a) සංවර්ධිත රටවල සත්ත්ව පාලන කටයුතු වල දක්නට ලැබෙන ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න.

b) ලෝකයේ සත්ත්ව පාලනයේ නිරතවන රටවල් වර්තමානයේ මුහුණපා ඇති ගැටළු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල.05)

06) (i) ශ්‍රී ලංකාවේ බහුලව භාවිත වන බලශක්ති ප්‍රභවයන් දෙක සඳහන් කරන්න. (ල.02)

(ii) • කොත්මලේ • ලක්ෂපාන • රන්දෙණිගල • සමනල වැව
ඉහත සඳහන් ජල විදුලි බලාගාර අතුරෙන්,
a) කැලණි ගඟට සම්බන්ධ ජල විදුලි බලාගාරයක්ද,
b) මහවැලි ගඟට සම්බන්ධ ජල විදුලි බලාගාරයක් ද,
c) වලවේ ගඟට සම්බන්ධ ජල විදුලි බලාගාරයක් ද, සඳහන් කරන්න. (ල.03)

(iii) බලශක්ති පරිහරණයේදී ශ්‍රී ලංකාව මුහුණපාන ගැටළු දෙකක් සඳහන් කර, බලශක්ති සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම කරුණු දෙකක් මඟින් පැහැදිලි කරන්න. (ල.05)

07) (i) ලෝකයේ වැඩිම ජන සංඛ්‍යාවක් වෙසෙන මහාද්වීප දෙක සඳහන් කරන්න. (ල.02)

(ii) ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික හා මානුෂ්‍ය සාධක තුනක් සඳහන් කරන්න. (ල.03)

(iii) ලෝකයේ ජනාධික කලාප ආශ්‍රිතව මතුවී ඇති ගැටළු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

08) (i) "සංවර්ධනය" යන්න සඳහා සුදුසු නිර්වචනයක් සපයන්න. (ල.02)

(ii) වේගවත්ව සිදුවන සංවර්ධන ක්‍රියාවලි නිසා පරිසරයට එල්ලවන බලපෑම් තුනක් දක්වන්න. (ල.03)

(iii) a) දුම්රිය මාර්ග හා මහා මාර්ග දියුණු කිරීමෙන් ශ්‍රී ලංකාවට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

b) ග්‍රාමීය ප්‍රදේශවල පහසුකම් වැඩියුණු කිරීමෙන් ලබාගත හැකි වාසි තුනක් සඳහන් කරන්න.

(ල.05)

* * * *

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved




| 11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 61 |
|---|---|---|

(01) භූගෝල විද්‍යාව II
பவியியல் II
Geography II


| | | පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. For Examine's Use Only. |
|---|---|---|
| 1. | (අ) / (அ) / (a) | |
| | (i) ............................................................ | |
| | (ii) ............................................................ | |
| | (iii) ............................................................ | |
| | (iv) ............................................................ | |
| | (v) ............................................................ | |
| | (vi) ............................................................ | |
| | ............................................................ | |
| | (vii) ............................................................ | |
| | (viii) ............................................................ | |
| | (ix) ............................................................ | |
| | | 10 |

(ආ) /(ஆ) / (b)




| | |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (vi) | |
| (v) | |
| | |

(ඇ) /(இ) / (c)




| | |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (vi) | |
| (v) | |
| | |

1. (අ) (அ) (a) $\overline{10}$ (ආ) (ஆ) (b) $\overline{5}$ (ඇ) (இ) (c) $\overline{5}$ = $\overline{20}$

3. (ඉ)/ (இ)/ (c)

| | |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (vi) | |
| (v) | |




1 : 50,000